Buddhist Era 2546 Duruthu First Quarter - Friday, January 10,2003



නව විදුලි ආලෝක පද්ධතියෙන් බැබළෙන චෛත්‍යය

## බුදු ඇසින් දුටු යළි උපත

– කුරුණෑගොඩ පියතිස්ස නාහිමි

මරණින් පසු උපතක් පිළිබඳ විවිධ ආගම්, දර්ශන සහ චින්තකයන් විසින් පළ කරන ලද අදහස් සමග තුලනාත්මක ලෙස බෞද්ධ දර්ශනයෙන් ඉගැන්වෙන පුනර්භව සංකල්පය පිළිබඳ විමසා බැලීමක්.

## ළමා පරපුර උදෙසා ආගමික වැඩ සටහනක්

– බන්දුල අත්තනායක

වෙනිවැල්කොළ සම්බෝධි යෝගාශ්‍රමය මගින් – පාසල් සිසු සිසුවියන් වෙනුවෙන් නිවාඩු කාලය තුළ දී ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධානය කරන ලද විශේෂ සීල සමාදන වැඩ සටහනක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් හෙළි කැරේ. කොළඹ – හොරණ මාර්ගයේ කහතුඩුව හන්දියෙන් දියකඩ මාර්ගයට හැරී කිලෝමීටර් දෙකක් පමණ යන විට මෙම භාවනා මධ්‍යස්ථානය හමුවේ.

## සහනදායක දිවියකට ධර්මය බලපාන හැටි

– හාරිස්පත්තුවේ අරියවංසාලංකාර හිමි

ධර්මය භාවිතා කිරීමෙන් ලද හැකි ජීවිත තෘප්තිය. විවිධ වූ විෂම වූ ලෝකයක – විවිධ වූ ජීවන ගැටලු හා අර්බුද හමුවේ – සහනසීලී මනසකින් යුතුව සුවපත් ජීවිතයක් ගත කිරීම සඳහා බුදු දහමෙන් ලද හැකි මග පෙන්වීම.

## නාගාර්ජුන කොණ්ඩ

– පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරා විද්‍යා සහකාර අධ්‍යක්ෂ සිරිසමන් විජේතුංග

'සයුරෙන් එහා' විශේෂාංගය යටතේ බෞද්ධ කලා නිර්මාණ රැසක් ඇතුළත් ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ පිහිටා ඇති පැරැණි බෞද්ධ මධ්‍යස්ථානයක් පිළිබඳ තොරතුරු.

## දිවි මග සරසන සිල් සුවඳ

– ගොඩගම මංගල හිමි

බුදු දහමේ දැක්වෙන විමුක්ති මාර්ගයට අයත් ත්‍රිශික්ෂාවෙන් එකක් වූ සීල ප්‍රතිපදාවෙහි යහපත් ප්‍රතිඵල පිළිබඳ බුද්ධ දේශනාවකට අර්ථකථනයක් – දුරුතු පුර අටවක පෝද ධර්ම දේශනාවෙන්.

## සත්ව ලෝකය තුළ මිනිසාට හිමිවන තැන

– එච්. ජී. පියසේන

ජීව ලෝකයේ විවිධත්වය සහ ඒ තුළ මනුෂ්‍යයාට හිමි වන ස්ථානය. සත්ව ලෝකය හා සත්වයන් නොවන ජීව ලෝකය ගැන ද අදහස් කීපයක් – මෙම ලිපියෙහි දැක්වේ.

## රම්බඩගල්ල විහාරය

කුරුණෑගල රිදීගම පිහිටි පැරැණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. ශ්‍රී ලංකාවේ විශාලතම ශෛලමය බුද්ධ ප්‍රතිමාව මෙම විහාරස්ථානයෙහි ගොඩනැගීමට කටයුතු සකස් කෙරෙමින් තිබෙන බව ලේඛකයා පවසයි.

## දිව්‍යමය විවාහය

– බී. ඒ. විමලසේන

විවාහ ජීවිතය විධිමත් කිරීම සඳහා බුදු දහම තුළින් ලබාගත හැකි මග පෙන්වීම. සාර්ථක යුග දිවියක් ගත කිරීමට අවශ්‍ය බොදු උපදෙස්.

## Rebirth

***-by Ven. Kurunegoda Piyatissa Nayaka Thera***